රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.06**

**නිවේදන අංකය: 433 /2021**
**නිකුත් කළ වේලාව:22:15**

**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)**
**ප්‍රවෘත්ති කර්තෘ**

**<u>අද කොවිඩ් මරණ 11 යි</u>**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 11 ක් අද (06) දිනට අදාලව තහවුරු කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 745 කි.

01. ඉනාමලුව ප්‍රදේශයේ පදිංචි 73 හැවිරිදි කාන්තාවකි. පොලොන්නරුව මහ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් අසාදිතයකු බව හඳුනාගැනීමෙන් පසුව වැලිකන්ද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 මැයි මස 05 වන දින මිය ගොස් ඇත. වකුගඩු අකර්මන්‍යතාවය සහ කොවිඩ් නියුමෝනියා තත්වය මරණයට හේතුව ලෙස දැක්වෙයි.

02. කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචි 52 හැවිරිදි කාන්තාවකි. කුරුණෑගල පෞද්ගලික රෝහලක ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් අසාදිත බව හඳුනාගැනීමෙන් පසුව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 මැයි මස 06 වන දින මිය ගොස් ඇත. කොවිඩ් නියුමෝනියාව හේතුවෙන් ඇතිවූ හෘදයාබාධ තත්වය සහ බහුඉන්ද්‍රිය අක්‍රියවීම මරණයට හේතුව ලෙස දැක්වෙයි.

03. කටුවන ප්‍රදේශයේ පදිංචි 71 හැවිරිදි කාන්තාවකි. කටුවන මූලික රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 මැයි මස 02 වන දින කොවිඩ් 19 නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

04. බෙන්තොට ප්‍රදේශයේ පදිංචි 55 හැවිරිදි පුරුෂයෙකි. දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් අසාදිත බව හඳුනාගැනීමෙන් පසුව උඩුගොඩ දිස්ත්‍රික් රෝහල වෙත මාරු කර යවා ඇත. 2021 මැයි මස 06 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

05. සිඳුව ප්‍රදේශයේ පදිංචි 68 හැවිරිදි කාන්තාවකි. වැලිසර ලය රොහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් අසාදිතයකු බව හඳුනාගැනීමෙන් පසුව මුල්ලේරියාව මූලික රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 මැයි 04 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර ශ්වසන අපහසුතා සින්ඩ්‍රෝමය සහ කොවිඩ් නියුමෝනියා තත්වයයි.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவெனியு, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk

06. මල්ලවගෙදර ප්‍රදේශයේ පදිංචි 78 හැවිරිදි කාන්තාවකි. මොරටුව දිස්ත්‍රික් රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් ආසාදිත බව හඳුනාගැනීමෙන් පසුව මුල්ලේරියාව මූලික රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 අප්‍රේල් මස 30 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ හෘද රෝගී තත්වය සහ කොවිඩ් අසාදිත තත්වයයි.

07. ගෙලිඔය ප්‍රදේශයේ පදිංචි 75 හැවිරිදි පුරුෂයෙකි. පේරාදෙණිය ශික්ෂණ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි මස 06 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මිය ගොස් ඇත.

08. යාපනය ප්‍රදේශයේ පදිංචි 77 හැවිරිදි පුරුෂයෙකි. යාපනය ශික්ෂණ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි මස 05 වන දින මියගොස් ඇත. ශ්වසන මාර්ගයේ අසාදනය නිසා ඇතිවූ ලේ විෂවීමේ කම්පනය සහ වම් පාදයේ පහළ කොටසේ වූ තුවාලය මරණයට හේතුව ලෙස දැක්වේ.

09. උඩවලව ප්‍රදේශයේ පදිංචි 72 හැවිරිදි කාන්තාවකි. ඇඹිලිපිටිය දිස්ත්‍රික් රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 පෙබරවාරි මස 21 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියා තත්වයයි.

10. බුළුතොට ප්‍රදේශයේ පදිංචි 43 හැවිරිදි පුරුෂයෙකි. කොලොන්න මූලික රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව ඇඹිලිපිටිය දිස්ත්‍රික් රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 අප්‍රේල් මස 29 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

11. කොළඹ 03 ප්‍රදේශයේ පදිංචි 81 හැවිරිදි කාන්තාවකි. 2021 මැයි මස 05 වන දින කොළඹ ජාතික රෝහලට ඇතුලත් කරන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව අධි රුධිර පීඩනය සහ දියවැඩියා තත්වයයි.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**